නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ව්‍යාපාර අධ්‍යයනය - 12 ශ්‍රේණිය

## ඒකක පරීක්ෂණය - 03

**(රජය හා ව්‍යාපාර)**

නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10,
Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10, නාලන්දා විද්‍යාලය - කොළඹ 10, Nalanda College - Colombo 10,

**නිවැරදි පිළිතුර තෝරන්න.**

(01) රජය ව්‍යාපාරවලට මැදිහත් වන ආකාරය x තීරුවේ ද ඒ සඳහා නිදසුන් y තීරුවේද දැක්වේ.

| x | y |
|---|---|
| 1. යටිතල පහසුකම් සැපයීම. | A. ලක් සතොස හරහා භාණ්ඩ විකිණීම. |
| 2. ගණුදෙනුකරුවෙකු වීම. | B. විදුලි බලය සැපයීම. |
| 3. ප්‍රතිපත්ති සම්පාදනය කිරීම. | C. ව්‍යාපාර නාම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම. |
| 4. නීතිරීති පැනවීම. | D. ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම. |

x තීරුවේ ඇති රජය ව්‍යාපාරවලට මැදිහත්වන ආකාරය සඳහා ගැලපෙන නිදසුන් y තීරුවෙන් ගැලපූ විට විවැරදි පිළිතුර දැක්වෙන පේළිය තෝරන්න.

i. 1 - A, 2 - D, 3 - B, 4 - C,
ii. 1 - B, 2 - A, 3 - D, 4 - C,
iii. 1 - B, 2 - A, 3 - C, 4 - D,
iv. 1 - A, 2 - B, 3 - C, 4 - D,
v. 1 - D, 2 - B, 3 - C, 4 - A,

PROOF ONLY

(02) ව්‍යාපාර කටයුතු සඳහා රජය මැදිහත්වන ආකාරය සඳහා ගැලපෙන නිදසුන් y තීරුවෙන් ගැලපූ විට නිවැරදි පිළිතුර දැක්වෙන පේළිය තෝරන්න.

A. රටක ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම.

B. ව්‍යාපාර ආචාරධර්ම අනුව ව්‍යාපාර කටයුතු සිදු කිරීම.

C. ව්‍යාපාර තරඟකරුවන් අතර සුහදතාවය වර්ධනය කිරීම.

D. සුබසාධන භාණ්ඩ හා පොදු භාණ්ඩ සැපයීම.

E. ඒකාධිකාරී හා අහිතකර ව්‍යාපාර පරිචයන් සීමා කිරීම.

F. සමාජ හා පරිසර ලැදියාව ආරක්ෂා කිරීම.

(03) පහත සඳහන් කරුණු අතුරින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා සම්බන්ධ ප්‍රකාශය කුමක් ද?

i. ආදායම් බදු ප්‍රතිශතය ඉහළ නැංවීම.

ii. රාජ්‍ය වර්තන වියදම් අඩු කිරීම.

iii. පොළී අනුපාතිකය ඉහළ නැංවීම.

iv. වාර්ෂික අයවැය ලේඛනයෙහි හිඟය අඩු කිරීම.

v. රාජ්‍ය ප්‍රාග්ධන වියදම් ඉහළ නැංවීම.

(04) ව්‍යාපාර කටයුතු පාලනය කිරීම සඳහා උපයෝගී කරගනු ලබන මූලික ප්‍රතිපත්ති හා ඒ යටතේ අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග කිහිපියක් පහත දැක්වේ.

| **ප්‍රතිපත්තිය** | **ක්‍රියාමාර්ග** |
|---|---|
| 1. පිස්කල් ප්‍රතිපත්තිය. | A - විවිධ වෙළඳපල කටයුතු |
| | B - වර්තන වියදම් වැඩිකිරීම |
| | C - සංචිත අවශ්‍යතා වෙනස් කිරීම |
| 2. මූල්‍ය ප්‍රතිපත්තිය | D - ණය සීමා පැනවීම |
| | E - ආනයන සඳහා බදු වැඩි කිරීම |
| | F - යටිතල පහසුකම් සංවර්ධනය |

ප්‍රතිපත්ති හා ඒවාට අදාල ක්‍රියාමාර්ග නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

i. 1 - A E F 2 - B C D

ii. 1 - B E F 2 - A C D

iii. 1 - B D E 2 - A C F

iv. 1 - A C D 2 - B E F

v. 1 - C D E 2 - A B F

PROOF ONLY

(05) පහත සඳහන් වන්නේ රජයකට ලැබෙන ආදායම් සහ රජයක් විසින් දරණු ලබන වියදමය.

A - දඩමුදල්
B - වැටුප් හා වේතනය
C - එකතු කල අගය මත බදු
D - බලපත්‍ර ගාස්තු
E - මහාමාර්ග ඉදිකිරීම්
F - මුද්දර ගාස්තු

ඉහත සඳහන් ඒවායින් බදු නොවන ආදායමට අයත් වන්නේ

i A,D,F ii A,B,F iii B,D,E iv D,E,F v C,D,E

(06) රජයක් විසින් ඉටුකර ගැනීමකට අපේක්ෂා කරන ප්‍රධාන ආර්ථික අරමුණු දෙකක් වන්නේ

i. ආර්ථික ස්ථායිතාවය හා සාධාරණ ආදායම් ව්‍යාප්තිය.

ii. ආර්ථික වර්ධනය හා ව්‍යාපාරවල විකුණුම් උපරිම කිරීම.

iii. ව්‍යාපාරවල විකුණුම් උපරිම කිරීම හා ඒමගින් ලාබ උපරිම කිරීම.

iv. පූර්ණ සේවා නියුක්තිය හා රජයේ බදු අදායම් ඉහළ තැබීම.

v. රටේ මහජනයාගේ පිළිගැනීම ලබා ගැනීම හා ගෙවුම් ශේෂය යහපත් කිරීම.

(07) වෙළෙඳ විෂමාචාරයක් ලෙස සැලකිය හැක්කේ පහත දෑ අතරින් කවරක්ද ?

i. සේවකයින්ට අදාළ වැටුප් නොගෙවීම.

ii. ව්‍යාපාරික ස්ථානය පිරිසිදුව තබා නොගැනීම.

iii. ගනුදෙණුකරුවන් සමග මනා සබඳතාවයක් පවතීම.

iv. සේවකයා රැකියාවෙන් ඉවත් කිරීම.

v. භාණ්ඩ ලේබල් වල මිල වෙනස් කිරීම.

PROOF ONLY

(08) පහත වගුවේ x තීරුවේ ජාත්‍යන්තර ප්‍රමිති කිහිපයක් ද y තීරුවේ ඒවායින් ආවරණය වන පද්ධති ද දැක්වේ.

| x | y |
|---|---|
| 1. ISO 9001 | A. සංවිධානමය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ කළමනාකරණ පද්ධති. |
| 2. ISO 14001 | B. ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධති. |
| 3. ISO 22000 | C. ආයතනයට පරිසර කළමනාකරණ පද්ධති. |
| 4. OHSAS 18001 | D. ආයතනමය තත්ව කළමනාකරණ පද්ධති. |

x හා y නිවරදිව ගලපා ඇති පිළිතුර තෝරන්න.

i. 1-D, 2-C, 3-B, 4-A

ii. 1-B, 2-D, 3-C, 4-A

iii. 1-D, 2-B, 3-C, 4-A

iv. 1-B, 2-A, 3-D, 4-C

v. 1-C, 2-B, 3-D, 4-A

PROOF ONLY

(09) SLS ප්‍රමිති ලාංඡනය ලැබීමෙන් ව්‍යාපාරවලට අත්වන ප්‍රතිලාභයක් නොවන්නේ,

i. පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකිවීම.

ii. ගෙවන මුදලට උපරිම තෘප්තියක් ලැබීම.

iii. ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය වීම.

iv. තරඟකාරිත්වයට මුහුණ දිය හැකිවීම.

v. නාස්තිය අවම කර ගත හැකිය.

(10) තම ප්‍රදේශයේ ඇති ආපන ශාලාවක අපිරිසිදු ලෙස ආහාර සකසන බව දැනගත් පරිභෝගිකයකු මේ පිළිබඳව අදාළ බලධාරීන්ට දැනුම් දීමට අදහස් කරයි මේ සම්බන්ධව ඔහුට ඇති අයිතිය වන්නේ.

i. තෝරා ගැනීමට ඇති අයිතිය.

ii. වන්දි ලබාගැනීමට ඇති අයිතිය.

iii. සවන් යොමුකරවා ගැනීමට ඇති අයිතිය.

iv. ආරක්ෂාව සලසාගැනීමට ඇති අයිතිය.

v. සුවදායක පරිසරයක ජීවත්වීමට ඇති අයිතිය.

**අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන වචන යොදා හිස්තැන් පුරවන්න.**

(11) නිශ්පාදන ක්‍රියාවලියේ අඛන්ඩ වර්ධනය තුළින් ................................................................................................
.............................................................. සිදුවන අතර මානව හා සමාජ දර්ශකවල දිගුකාලින වර්ධනය
.................................................................................................... ලෙස හඳුන්වයි.

(12) සර්ව ආර්ථික ස්ථායිතාවය ආරක්ෂාකර ගැනීම.......................................................................................
අරමුණ වන අතර රජයේ මූල්‍ය ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ දේශිය ආර්ථිකය තුර ...........................
.................................................................. පවත්වා ගැනීම.

(13) යම් පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් අනිවාර්යෙන්ම ගෙවිය යුතුයැයි රජය හෝ රජයේ බලාධිකාරි ආයතනයක් විසින් නියම කරනු ලබන ගෙවීමක් .................................................................
ලෙස හඳුන්වන අතර විදේශිය රටවලින් ආනයනය කරන භාණ්ඩ සඳහා රේගුවේදි අයකරන බදු
.............................................................................. වේ.

(14) රාජය සේවා අඛණ්ඩව පවත්වාගැනීම සඳහා වසරක් තුළ නැවත නැවත සිදුකල යුතු වියදම්
............................................................................. ලෙස හඳුන්වන අතර රජයක් විසින් දිගුකාලීන ආයෝජන සඳහා දරන වියදම් ................................................................................. වේ.

PROOF ONLY

(15) පාරිභෝගිකයා ගෙවන මුදලට ප්‍රමාණවත් තෘප්තියක් ලබාදීම සහතික කිරීම පිණිස සලසා ඇති නීතිමය ආවරණය ........................................................................................ වේ.

**අංක16 සිට 20 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.**

(16) රජයක ආර්ථික අරමුණු හතරක් ලියන්න.

1) ........................................................................................

2) ........................................................................................

3) ........................................................................................

4) .......................................................................................

(17) බදු නොවන ආදායම් සඳහා නිදසුන් හතරක් ලියන්න.

1) ........................................................................................

2) ........................................................................................

3) ........................................................................................

4) .......................................................................................

18) මුල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන උපකරණ හතරක් ලියන්න.

1) ........................................................................................

2) ........................................................................................

3) ........................................................................................

4) .......................................................................................

PROOF ONLY

19) පාරිභෝගික වගකීම් නම් කරන්න.

1) ..........................................................................

2) ..........................................................................

3) ..........................................................................

4) ..........................................................................

20) ශ්‍රී ලංකාවේ පාරිභෝගික ආරක්ෂණය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන හතරක් ලියන්න.

1) ..........................................................................

2) ..........................................................................

3) ..........................................................................

4) ..........................................................................

PROOF ONLY